යම් කිසි වරදකට කාන්තා සහ පුරුෂ යන දෙපාර්ශවයම චෝදනා ලබනා අවස්ථාවකදී පවා, එකී වරද සම්බන්ධයෙන් කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කොට දක්වමින් වාර්තා කිරීමේ නැඹුරුතාවයක් ඇතැම් විට මාධ්‍ය තුළ දැකීමට හැක. පහත පුවත් සිරස්තල ඊට නිදසුන් ලෙස දැක්විය හැක.

"බන්ධනාගාරගත රූඩ්වියාගේ මත් ජාවාරම මෙහෙය වූ දෙදෙනා දැලේ, අයෙක් කාන්තාවක්." - දිවයින (ජූනි 29, 2022)

"සිසුන් තිදෙනෙක් ඉස්කෝලේ විද්‍යාගාරය කඩා කොම්පියුටර් උස්සලා, සිසුවියකුත් ඒ අතර." - අරුණ (ජූනි 22, 2022)

1) මෙලෙස එකම වරද සම්බන්ධව කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කිරීම, කාන්තා පාර්ශවයට එකී වරදෙහි වැඩි වගකීමක් පැටවීමක් යැයි ඔබ සිතන්නේ ද?

2) එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොට ගත් කොන් කිරීමක් නොවන්නේ ද?

3) "අයෙක් කාන්තාවක්", "සිසුවියකුත් ඒ අතර" යන කොටස් නොමැතිව පවා ඉහත සිරස්තල ඔස්සේ අදාළ පුවත නිරවද්‍යව ලබා දීමට නොහැකිද?

අදාළ නොවන තැන කාන්තාවන් සෘණාත්මකව ඉස්මතු නොකරමු!